# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2352/18 - 2023 ඔක්තෝබර් මස 04 වැනි බදාදා - 2023.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: DIVNA/LAD/LA/ACQUI/4/15.
*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4-3/9/2018/A/484.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1076, දඹගිරිගම බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිගන්දෙනිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් 2022.12.30 දිනැතිව මැන සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 219 අතිරේක අංක 10 පත්‍ර අංක 10 දරන පිඹුරේ කැබලි අංක 346,347 වශයෙන් දැක්වෙන "කොවුල්වැව ගොවිපල" නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.0233 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අංක 346**
ඉඩමේ නම: කොවුල්වැව ගොවිපල; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය; ප්‍රමාණය: හෙක්ටයාර් 1.9216.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 10.00ට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023 ඔක්තෝබර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

**ඩබ්. පී. සී. එන්. පතිරණ,**
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0020

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: THI/LND/L2/ACQVI/147.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/12/2018/WS/257.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් දුමින්ගු හේවාගේ උදයාන්ගනී සඳමාලි වන මම මාතර IV වන අදියර ජල යෝජනා ක්‍රම යටතේ

1A - G 040431 - 24 (2023/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ගල්කැටිය භූගත ජලාශය හා ස්ථාන භාරකරු නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2022.11.25 දිනැති අංක 2307/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ *ගැසට්* නිවේදනයේ ශුද්ධි පත්‍රිකාව හිමිකම් පරීක්ෂණ දිනය 2023.11.06 දින ලෙස ද, ඊට අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනය 2023.10.23 දින ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**ඩී. එච්. යූ. සඳමාලි,**
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2023 සැප්තැම්බර් මස 23 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0021

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.